# පෞරාණික ගෘහ භාණ්ඩවල සුන්දරත්වය ඔබට ගෙනෙන රාජ්‍ය දැව සංස්ථාව



**චමින්ද කුමාර මුතුමාල**
BSc.Agric.(Hons),MSc (Forestry & En .Mgt)
*කළමනාකාර (පර්යේෂණ හා පුහුණු)*
*රාජ්‍ය දැව සංස්ථාව.*

මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රමුඛතම වානිජ ආයතනයක් ලෙසට සැලකෙන රාජ්‍ය දැව සංස්ථාව ශ්‍රී ලංකාවේ දැව අවශ්‍යතාව සඳහා ප්‍රමුඛ දායකත්වය සපයමින් දැව කර්මාන්තයේ පුමුඛයා ලෙස ප්‍රමුඛ ස්ථානයක පසුවේ.තිරසර සංවර්ධනය සඳහා තිරසාර වන කළමනාකරණය තුලින් සිය සේවාව ඉටු කරන රාජ්‍ය දැව සංස්ථාව එමගින් රටේ දැව අවශ්‍යතාවය සපුරාලිමට ජාතික දායකත්වයක් සැපයීම සඳහා කඳන්, ඉරූ දැව, සිල්පර විදුලිකණු සහ අලිවැට කණු සපයන අතර, කාර්යාල ගෘහ භාණ්ඩ මෙන්ම පාරම්පරික ගෘහ භාණ්ඩ නිර්මාණය කිරීමේ සුවිශේෂී කාර්යයක නියැලී සිටී. එමෙන්ම ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශයේ ගෘහ භාණ්ඩ අවශ්‍යතාවය සපුරාලන අතර, සිරිලක සිව්දෙස ජනතාවගේ ගෘහ භාණ්ඩ අවශ්‍යතාවය ද වගකීමකින් ඉටුකරමින් සිටී.

රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදනය වන ගෘහ භාණ්ඩ සියල්ලක්ම හොඳින් පදම් කොට (Seasoning) දැවයේ එලය කොටස (Sap Wood) ඉවත් කර අරටුව කොටස (Heart Wood) පමණක් භාවිතා කරමින් විද්‍යානුකූල ලෙස නිෂ්පාදනය කෙරේ.දැවයක එලය හා අරටුව ශක්තිය අතින් (Strength) එක හා සමාන වුවද කල් පැවැත්ම සැලකිල්ලට ගෙන අරටුව කොටස් පමණක් ගෘහ භාණ්ඩ නිෂ්පාදනයට යොදා ගැනේ. තවද අති නවීන දැව ඉරුම්හල් මගින් දැව කඳන් නියමිත ප්‍රමිතිය සුරැකෙන පරිදි නියමිත මිම් අනුව පරිවර්තනය කොට ගෘහ භාණ්ඩ තැනීමට භාවිතයට ගැනේ.කාර්යක්ෂම දැව භාවිතයකදී තිබිය යුතු දැවයක පැවතිය යුතු අවම ඝනකම (Minimal Thickness) සහ හරස්කඩ ප්‍රමාණයේ (Real Scale of the cross section) වැනි කරුණු ඉතාමත් සැලකිල්ලට ගනිමින් දැව කොටස් වල ශක්තිය (Strength) සුරැකෙන පරිදි සියළු ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාරතුළදී නිෂ්පාදන කාර්යය ඉටු කරයි.

එක් එක් ගෘහ භාණ්ඩ සෑදීම සඳහා උචිතම දැව වර්ග අවස්ථානුකූලව භාවිතා කරන අතර, කළුවර, බුරුත,කොස්, තේක්ක, කුඹුක්, මිල්ල, ග්‍රෑන්ඩිස් වැනි තද දැව (Hard Wood) මෙන්ම පයිනස් වැනි මෘදු දැව (Soft Wood) ද ගෘහ භාණ්ඩ නිෂ්පාදනයට යොදා ගැනේ. තවද පයිනස් වැනි දැව විශේෂ බෝරෝන් පරිරක්ෂණ ක්‍රියාවලියකට භාජනය කොට (BoronTreatment) කල්පැවැත්ම සහ නිමාව වැඩි කරමින් අපගේ නිෂ්පාදනය සඳහා මෑතක සිට යොදා ගැනේ.දැව ගබඩා කිරීමේදී මෙන්ම පදම් කිරීමේදී නිසි තත්ත්වය(Quality) හැඩය (Shape) සහ කල් පැවැත්ම (Durability) සුරැකෙන පරිදි නිසි නියමිත විද්‍යාත්මක ප්‍රමිතීන් සහ ක්‍රියාවලියන් භාවිතා කර ගනිමින් ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය දැව අමු ද්‍රව්‍ය ලබා ගන්නා බැවින් රාජ්‍ය දැව සංස්ථාවේ ගෘහ භාණ්ඩ කල් පවතින අනර්ඝ තත්ත්වයෙන් සුරැකෙන පරිදි නිර්මාණය වන බව නිසැකවම කිව හැකිය.













පැරණි ගෘහ භාණ්ඩ නිවසේ තබා ගැනීම වර්තමානයේ නව විලාසිතාවක්ව පවතී. නමුත් මෙවැනි ගෘහ භාණ්ඩ මිල ගැනීමට අධික මුදලක් වැය කිරීමට සිදුවනවාක් මෙන්ම ඒවා සොයා ගැනීමටද අපහසුය. එවන් තත්ත්වයක් තුල රාජ්‍ය දැව සංස්ථාවේ පාරම්පරික ගෘහ භාණ්ඩ අද ඔබට පහසුවෙන් ලබා ගැනීමට හැකියාව ඇත.

පාරම්පරික ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී අතීත උරුමය සුරැකෙන පරිදි නිසි නිෂ්පාදන හා තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කරමින් , පාරම්පරික ශිල්පීන් ලවා එම කාර්ය ඉටු කරනු ලබයි. මෙම පාරම්පරික ගෘහ භාණ්ඩ නිර්මාණශිලීභාවයෙන් යුක්තව ඉපැරණි ගෘහ භාණ්ඩ වල ස්වරූපයෙන්ම කිසිදු වෙනසක් නොවන පරිදි නිෂ්පාදනය වේ.

රාජ්‍ය දැව සංස්ථාවේ පාරම්පරික ගෘහ භාණ්ඩ නිෂ්පාදන ඒකක ගාල්ල, බූස්ස, ප්‍රදේශයේ ස්ථානගත කර ඇති අතර, මෙම ඒකකයේ වැඩ කරන බොහෝ ශිල්පීන් මොරටුව, අම්බලන්ගොඩ සහ ගාල්ල අවට මෙම කර්මාන්තය පිළිබඳ හසල දැනුමකින් හෙබි ශිල්පීන් වීම නිසා රාජ්‍ය දැව සංස්ථාවේ පාරම්පරික ගෘහ භාණ්ඩ සඳහා අති විශාල ඉල්ලුමක් දිවයින පුරා පවතී. අම්පාර ප්‍රදේශයේ ශ්‍රී ලංකාවේ විශාලතම දැව ගෘහ භාණ්ඩ නිෂ්පාදන ඒකකය පිහිටුවා ඇති අතර, කල්දෙමුල්ල ප්‍රදේශයේ තවත් ගෘහ භාණ්ඩ ඒකකයක් පිහිටුවා ඇත.

මෙම නිෂ්පාදන ඒකක වල කරනු ලබන ගෘහ භාණ්ඩ අලෙවි කිරීම සඳහා ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාර රැසක් ශ්‍රී ලංකාව පුරා ස්ථානගත කොට ඇත.

ඔබගේ නිවාසවල සහ කාර්යාලවල දැව අවශ්‍යතා සඳහා මෙන්ම අනර්ඝ, කල්පවතින ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා වගකීමක් සහිත රාජ්‍ය දැව සංස්ථා අලෙවිසැල් වෙත පියනගන්න